13 - 5 - 1996


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ அதிவிசேஷமானது EXTRAORDINARY

අංක 917/2 – 1996 අප්‍රේල් 01 වැනි සඳුදා – 1996.04.01

917/2 ஆம் இலக்கம் – 1996 ஆம் ஆண்டு ஏப்பிறல் மாதம் 01 ஆம் திகதி திங்கட்கிழமை

No. 917/2 – MONDAY, APRIL 01, 1996

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.) (அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது) (Published by Authority)


# IV (අ) වැනි කොටස — පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව
### 1990 අංක 17 දරන මුදල් ප්‍රඥප්තිය
### 5 (1) වන වගන්තිය යටතේ නියෝගය

මධ්‍යම පළාතේ පළාත් සභාවේ 1990 අංක 17 දරන මුදල් ප්‍රඥප්තියේ 5 (1) දරන වගන්තියෙන් මාවෙත පැවරී ඇති බලතල ප්‍රකාර මධ්‍යම පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, නීතිය හා සාමය, ප්‍රාදේශීය පාලනය, සැලසුම්, ඉඩම්, පළාත් පාලන හා අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍ය වීරසූරිය දිසානායක මුදියන්සේලාගේ පුංචි බණ්ඩා දිසානායක වන මම මෙම නියෝගය මගින් පහත සඳහන් ව්‍යාපාර 1995 නොවැම්බර් මස 17 වැනි දින සිට පිරිවැටුම් බද්දෙන් නිදහස් කරමි:–

"ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 05 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද මධ්‍යම පළාතේ පිහිටි සමුපකාර සමිති".

ඩබ්. එම්. පී. බී. දිසානායක,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ
මුදල්, නීතිය සහ සාමය, ප්‍රාදේශීය පාලනය,
සැලසුම්, ඉඩම්, පළාත් පාලන හා අධ්‍යාපන
කටයුතු පිළිබඳ අමාත්‍ය.

04–406/1

---

### මධ්‍යම පළාතේ පළාත් සභාව
### 1990 අංක 17 දරන මුදල් ප්‍රඥප්තිය
### 7 (1) වන වගන්තිය යටතේ නියෝගය

මධ්‍යම පළාතේ පළාත් සභාවේ 1990 අංක 17 දරන මුදල් ප්‍රඥප්තියේ 7 (1) වගන්තියෙන් මාවෙත පැවරී ඇති බලතල ප්‍රකාර මධ්‍යම පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, නීතිය හා සාමය, ප්‍රාදේශීය පාලනය, සැලසුම්, ඉඩම්, පළාත් පාලන හා අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍ය වීරසූරිය දිසානායක මුදියන්සේලාගේ පුංචි බණ්ඩා දිසානායක වන මම 1990 දෙසැම්බර් මස 28 වැනි දින අංක 642/18 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ පළකරන ලද නියෝගය 1995 නොවැම්බර් මස 17 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් ලෙස සංශෝධනය කරමි:–

1 A – CP 020985 – 1,110 (96/04)

(1) එම නියෝගයේ (ඩ) විෂය යටතේ සිංහල පරිවර්තනයේ "ලී බඩු" යන වචනය වෙනුවට "ගෘහ භාණ්ඩ" යන වචනය ආදේශ කිරීමෙන් හා දෙමළ පරිවර්තනයේ (ட) විෂය යටතේ "*மரத்தளபாடங்கள்*" යන වචනය වෙනුවට "*தளபாடங்கள்*" යන වචනය ආදේශ කිරීමෙන්; සහ

(2) එම නියෝගයේ (ඩං) විෂයය යටතේ "සියයට 10" යන අනුප්‍රමාණය ඉවත්කොට ඒ වෙනුවට "සියයට 5" යන අනුප්‍රමාණය ආදේශ කිරීමෙන්.

ඩබ්. එම්. පී. බී. දිසානායක,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ
මුදල්, නීතිය සහ සාමය, ප්‍රාදේශීය පාලනය,
සැලසුම්, ඉඩම්, පළාත් පාලන හා අධ්‍යාපන
කටයුතු පිළිබඳ අමාත්‍ය.